# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 896/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 27/05/2024<br>පැය 1435 |

## මාධ්‍ය නිවේදනය

### 01. මාරක රිය අනතුරක් - නාරාහේන්පිට පොලිස් වසම.

2024.05.27 වන අද දින අළුයම් කාලයේදී නාරාහේන්පිට පොලිස් වසමේ ඇලවිටිගල මාවත මැල්වත්ත ප්‍රදේශයේදී නාරාහේන්පිට දෙස සිට බොරැල්ල දෙසට ධාවනය වූ යතුරු පැදියක් පදික මාරුව හරහා ගමන් ගත් පදික පුද්ගලයෙකුගේ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 65 ඇල්විටිගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුර සම්බන්ධයෙන් නාරාහේන්පිට පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - සෙවනගල පොලිස් ස්ථානය.

2024.05.26 වන දින රාත්‍රී කාලයේ සෙවනගල පොලිස් වසමේ තුංකමයාය ප්‍රදේශයේදී සෙවනගල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 64 ක් වන කිරිවැව, සෙවනගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සෙවනගල පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - එගොඩ උයන පොලිස් වසම.**

2024.05.26 වන දින දහවල් කාලයේ එගොඩඋයන පොලිස් වසමේ ඤානාලෝක මාවත ප්‍රදේශයේ මුහුදු තීරයට නාඳුනන මෘත ශරීරයක් ගොඩ ගසා ඇති බවට එගොඩ උයන පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත. වයස අවුරුදු 35 ත් 40 ත් අතර වයසේ පසුවන උස අඩි 05 යි අඟල් 04 ක් පමණ වන මුහුණ පුරා රැවුල වැවී ඇති පුද්ගලයෙකි**

මෘත ශරීරය කළුබෝවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර එගොඩ උයන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.05.26 වන දින සවස් කාලයේ බස්නාහිර පළාත් දූෂණ මර්ධන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ නාගලගම් වීදිය ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 255 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන නාගලගම් විදීය, කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. අයිස් මත්ද්‍රව්‍ය සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.05.26 වන දින දහවල් කාලයේ සංවිධානාත්මක අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් අනුව ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ මාදම්පිටිය පාර ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍යග්‍රෑම් 03 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන මාදම්පිටිය පාර, කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**